මාධ්‍ය නිවේදනයයි

# රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 2016 සඳහා වෙබ් අඩවියක්

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දු.අ.: 94-11-2147001 ෆැක්ස් අංකය: 94-11-2147011 විද්‍යුත් තැපැල: information@statistics.gov.lk

......................................................................................................................................

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයින් පිළිබඳ සංගණනය 2016 නොවැම්බර් මස 17 වන දින දිවයින පුරා පැවැත්වේ. සාමාන්‍යයෙන් වසර හතරකට වරක් පැවැත්වෙන මෙම සංගණනය මෙවර පවත්වනු ලබන්නේ එකොලොස් වන වරටයි.

තොරතුරු රැස් කිරීමේ කටයුතු සාර්ථකව ඉටු කර ගැනීම සඳහා මෙම සංගණනය සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ සහභාගීත්වයෙන් 2016 නොවැම්බර් මස 17 වන දින පෙ.ව. 9:30ත් පෙ.ව.11:30ත් දක්වා කාලය තුල සිදු කරන බව ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව දැනුම් දෙයි.

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින් පිළිබඳ සංගණනයේ සියලු තොරතුරු ඇතුලත් වෙබ් පිටුවක් එම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන **www.statistics.gov.lk** හි ඇතුලත් කොට ඇත. එහි සංගණනය සඳහා භාවිතා කරන ලේඛනවල (ප්‍රශ්ණාවලි, උපදෙස්, කේත ලැයිස්තු ආදී) පිටපත් සහ සංගනන ප්‍රශ්ණාවලියේ සියලුම ප්‍රශ්ණ පිරවීම සඳහා උපදෙස්, ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍ය වලින්, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ඇතුලත් කොට ඇති බව දෙපාර්තමේන්තුව තවදුරටත් දැනුම් දෙයි.

සංගණනය පිළිබඳව එහි ඇතුලත් කොට ඇති අදාල තොරතුරු සංගණන දිනට පෙර පරිශීලනය කොට 2016 නොවැම්බර් මස 17 වන දින පෙ.ව. 9:30ත් පෙ.ව.11:30ත් දක්වා කාලය අතරතුර දි සංගණන ප්‍රශ්ණාවලිය නිවැරදිව සම්පූර්ණ කොට මෙම සංගණනය සාර්ථක කර ගැනීමට සහය වන ලෙස ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයින්ගෙන් ඉල්ලා සිටී.

-------------------------------

ආචාර්ය ඒ.ජේ. සතරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

16/11/2